සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| පළමුවාර පරීක්ෂණය - 2018<br>First Term Test - 2018 | 11 ශ්‍රේණිය<br>Grade 11 |
| ශිල්ප කලා II<br>Art & Craft II | **කාලය පැය 2**<br>**Two hours** |

පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරක් සමඟින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. ඔබ පාසලේ 2018 නිවාසාන්තර ක්‍රීඩා උළෙලේ සියලු සැරසිලි විද්‍යාලීය ශිල්ප කලා ඒකකය වෙත පැවරී තිබුණි. 2018.02.09 දින පෑව 1.00 ට පැවැත්විය.
   - i. මෙදිනට පැමිණෙන ආරාධිත අමුත්තන් සඳහා ආරාධනා කිරීමට යොදා ගත් ආරාධනා පත්‍රිකාව ඇඳ දක්වන්න.
   - ii. ආරාධනා පත්‍රිකාව සකස් කිරීමට යොදා ගත් අමුද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
   - iii. ක්‍රීඩා උත්සවය දින සියලුම සැරසිලි සඳහා ස්වාභාවික අමුද්‍රව්‍ය භාවිතා කර තිබීම සියලු දෙනාගේ ප්‍රසාදයට ලක් විය. ඒ සඳහා යොදා ගන්නා ලද ස්වභාවික අමුද්‍රව්‍ය 4 ක් ලියන්න.
   - iv. ක්‍රීඩා උත්සව සංවිධායක මණ්ඩලය හඳුනා ගැනීම සඳහා නිල ලාංඡනයක් ලබා දී තිබුණේ ෂඩාස්‍රාකාර හැඩයකටය. පාදයක දිග 3 cm වූ සවිධි ෂඩාස්‍රයක් ඇඳ දක්වන්න.
   - v. ක්‍රීඩා ජයග්‍රහණ සඳහා ලබා දීමට ත්‍යාග තබා තබුණේ වේදිකාව කෙළවර තිබූ මේසයක් මතය. එම මේස රෙද්ද සිඳුරු තහඩු මුද්‍රණයෙන් අලංකාර කර තිබුණි. ඒ සඳහා සුදුසු මෝස්තරයක් ඇඳ වර්ණ ගන්වන්න.
   - vi. දේශීය තූර්ය වාදක කාණ්ඩායමේ ශිෂ්‍යාවන් පැළඳ සිටියේ ශිල්ප කලා විෂය හදාරන සිසුන් විසින් සකස් කරන ලද ආභරණ කට්ටලයකි එම ආභරණ සැකසීමට යොදා ගත හැකි මාධ්‍යන් හතරක් ලියන්න.
   - vii. පැළඳ සිටි ගෙලතැල්ලක රූප සටහනක් ඇඳ දක්වන්න.
   - viii. පොල්තෙල් පහණක් නිර්මාණයේදී ගොක් කොළ පොල් කොළ යොදා ගනිමින් අලංකාර වියමන් රාටාවක් යොදා ගෙන තිබුණි. ඒ සඳහා සුදුසු වියමන් රාටාවක් ඇඳ දක්වන්න.
   - ix. ආරාධිත අමුත්තන්හට රිබන් එම්බ්‍රොයිඩර් ක්‍රමයට අලංකාර කරන ලද බිත්ති සැරසිල්ලක් සමරු තිළිණයක් ලෙස ලබාදුනි. ඒ සඳහා යොදා ගන්නා ලද රිබන් මැහුම් ක්‍රම 2ක් ලියන්න.
   - x. ක්‍රීඩා උත්සවය නිල වශයෙන් නිමා කිරීමේ ප්‍රකාශය සිලින්ඩරාකාර ඇසුරුමක් තුල තබා තිබුනි. එම සිලින්ඩරය විකසනය කළ පසු පෙනෙන ආකාරය දළ රූප සටහනකින් අඳින්න.

2. ඈත අතීතයේ ශ්‍රී ලංකාවේ සිව්සැට කලාවක් තිබූ බව සඳහන්වේ.

i. සිව්සැට කලාව ප්‍රධාන කොටස් 2කි. එය කුමක්ද ?

ii. දෘෂ්‍ය කලාවන් 3ක් ලියා දෘෂ්‍ය කලාවන්ගේ දැකිය හැකි ලක්ෂණ 2ක් ලියන්න.

iii. වර්ත මානයේ ශ්‍රී ලංකාවේ ජනප්‍රියව පවතින ජන කලාවක් පිලිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

3. රෙදි පිළි අලංකරණයේදි සායම් භාවිත කර විවිධ අලංකරණ ක්‍රම යොදා ගනියි.

i. සායම් භාවිතයෙන් කරනු ලබන පිළි අලංරණ 3ක් ලියන්න.

ii. පිළි අලංකරණයට පෙර කරනු ලබන පෙර පරියම් ක්‍රම මොනවාද ?

iii. සිදුරුපතක් සැදීමට අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ ලියා සිදුරුපතකට සුදුසු මොස්තරයක් අඳින්න.

4. විසිතුරු අලංකරණ නිර්මාණ සඳහා විවිධ අමුද්‍රව්‍ය යොදා ගනියි.

i. නූල් භාවිත කර මැසිය හැකි විසිතුරු මැහුම් ක්‍රම 3ක් ලියන්න.

ii. රිබන් එම්බ්‍රොයිඩර් ක්‍රමයට බිත්ති සැරසිල්ලක් නිර්මාණයට අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ ලැයිස්තුගත කරන්න.

iii. සැහැල්ලු සෙල්ලම් සතුන් නිර්මාණයේදි විශේෂයෙන් අවධානයට යොමුකළ යුතු කරුණු මොනවාද ?

5. විවිධ භාණ්ඩ නිෂ්පාදනයේදි ජ්‍යාමිතික හැඩ තල යොදා ගනි.

i. විකසනය යන්න හඳුන්වන්න.

ii. පාදයක දිග 4 cm වූ සවිධි පංචාස්‍රය නිර්මාණය කරන්න.

iii. පහත සඳහන් ඝන වස්තුවෙහි විකසනය නිර්මාණය කරන්න.




6. ස්වාභාවික හා කෘතිම රෙදි උපයෝගි කරගෙන රෙදිපිළි නිෂ්පාදනය සිදුකරයි.

i. විවීම සඳහා කෙදි ලබා ගන්නා ශාක 2ක් හා සත්වයින් දෙදෙනෙකු නම් කරන්න.

ii. රෙදි විවීමේ යන්ත්‍ර වර්ග මොනවාද ?

iii. හැදයක දිග 100 m කි. පළල 40 cm කි. එක් සෙන්ටිමීටරයකට දික් නූල් පොටවල් 20 කි. මෙම හැදය විවීමට අවශ්‍ය දික් නූල් ප්‍රමාණය කැරලි වලින් සොයන්න.

7. පාෂාණ ජිරණය වීමෙන් මැටි නිර්මාණය වේ.

i. ශ්‍රී ලංකාවේ හමුවන ප්‍රධාන මැටි වර්ග 2 ක් ලියන්න.

ii. භාණ්ඩ නිෂ්පාදනයේදි යොදා ගන්නා ඇලෙන සුලු අමුද්‍රව්‍ය හා නොඇලෙන සුලු අමුද්‍රව්‍ය 3 බැගින් ලියන්න..

iii. මැටි භාණ්ඩ නිර්මාණය කර ගන්නා ක්‍රම 3 ක් ලියා එක් ක්‍රමයකට භාණ්ඩයක් සාදා ගන්නා ආකාරය විස්තර කරන්න.